# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2022**
**2024 දෙසැම්බර් / 2025 ජනවාරි**

**මානවශාස්ත්‍ර පීඨය**

**ක්‍රිස්තියානි සංස්කෘතිය (නව නිර්දේශය)**

**ක්‍රිස්තියානි ඉතිහාසය CHCU – 28214**

එක් කොටසකින් ප්‍රශ්න දෙකක් (02) ඇතුළත් වන සේ
ප්‍රශ්න **පහකට** (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 12 යි.** **කාලය : පැය 03 යි.**

---

පළමුවන කොටස - ලෝක සභා ඉතිහාසය

01. අ) මුල් කිතුනු සභාවේ සාධාර්මික ධර්මයට බලපෑ දුර්මත දහයක් (10) නම් කරන්න.

    ආ) ක්‍රිස්තුවේදීය දුර්මත දෙකක් (02) පිළිබඳව අදහස් දක්වන්න.

02. ගෝත්‍රික ජනයාගේ සංවර්තනයෙන් පසු යුරෝපය තුළ ක්‍රිස්තියානි ආගම ව්‍යාප්ත වූ ආකාරය විමසන්න.

03. ක්‍රිස්තු වර්ෂ 1054 දී නැගෙනහිර සභා භේදයට බලපෑ හේතු සාධක විස්තර කරන්න.

04. ලූතරානු ප්‍රතිසංස්කරණයට පසුබිම් වූ කරුණු පැහැදිලි කරන්න.

05. අ) දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ නිර්දේශ 16 නම් කරන්න.

    ආ) ව්‍යවස්ථා (constitutions) සතර පිළිබඳ සටහනක් ලියන්න.

06. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් (02) පිළිබඳ සවිස්තර සටහන් ලියන්න.

    අ) කිතුනු තාපස ප්‍රගමනය
    ආ) ප්‍රතිමාභංගන අර්බුදය
    ඇ) නිල පැවරුම් අර්බුදය
    ඈ) ට්‍රෙන්ට් මන්ත්‍රණ සභාවෙන් ප්‍රකාශිත මූලික තීරණ
    ඉ) පළමු වතිකාන මන්ත්‍රණ සභාවෙන් ප්‍රකාශිත ධර්මසිද්ධාන්ත ව්‍යවස්ථාව

## දෙවන කොටස - ලංකා සභා ඉතිහාසය

07. 'පෘතුගීසීන්ට පෙර ශ්‍රී ලංකාවේ කිතුනුවෝ' යන ප්‍රකාශය විචාරාත්මකව විමසන්න.

08. පෘතුගීසි යුගයේ කතෝලික ධර්මදූත ක්‍රමවේද කෝට්ටේ රාජ්‍ය කේන්ද්‍ර කරගනිමින් පැහැදිලි කරන්න.

09. ජුසේ වාස් පියතුමාගේ ධර්මදූත ප්‍රතිපත්ති විචාරයට ලක්කරන්න.

10. අ) ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමාගේ සිංහල ග්‍රන්ථාවලියේ ලේඛන දහයක් (10) නම් කරන්න.

ආ) ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමාගේ සිංහල ග්‍රන්ථාවලියේ සාහිත්‍යික අගය පැහැදිලි කරන්න.

11. ලාංකේය පාස්කු-දුක්ප්‍රාප්ති නාට්‍යයේ ඉතිහාසය හා වර්තමාන භාවිතය පිළිබඳ රචනාවක් ලියන්න.

12. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් (02) පිළිබඳව සවිස්තර සටහන් ලියන්න.

අ. පෘතුගීසි යුගයේ මහනුවර හෝ යාපනය යන රාජ්‍යයන් මුල්කරගත් කතෝලික ධර්මදූත ප්‍රගමනය

ආ. මෙතෝදිස්ත හෝ බැප්ටිස්ත සභාවන්ගේ ලාංකේය ඉතිහාසය

ඇ. බ්‍රිතාන්‍ය යුගයේ කිතුනු අධ්‍යාපනය

*****************************